# තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික යොවුන් සේනාංකය

## ඇබෑර්තු

ජාතික යොවුන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) (HM 1-1)**

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දයකත්වය හිමිය.

මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම,

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**අතිරේක අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය) (HM 1-1) - මූලස්ථානය සඳහා**

**අධ්‍යාපන සුදුසුකම්** : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ව්‍යාපාර කළමනාකරණවේදී (මානව සම්පත්) විශේෂ, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) විශේෂ, නීතිවේදී, ශ්‍රම අධ්‍යාපනවේදී, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය), වාණිජවේදී (සාමාන්‍ය) යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සමග**

රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, නීති විෂයයන්, සේවක හා මානව සම්පත් කළමනාකරණය, දේශපාලන විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ පරිපාලන, කළමනාකරණය, මූල්‍ය විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් පරිපාලන හා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් පරිපාලන හා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සේවා (MM)සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස** : ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** : HM 1-1 - 2/2016 රු.81,670-15X2,270 = රු.115,720 මීට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

මෙම තනතුර සඳහා අයදුම්කරන්නන් සුදුසු ආකෘතියක් අනුව අයදුම්පතක් පිළියෙළ කොට ඉල්ලුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර අදාළ සහතිකවල ඡායා පිටපත් සමගින් 2021.02.19 දින හෝ ඊට ප්‍රථම අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ **vacancy@youthcorps.lk** යන විද්‍යුත් තැපැල මගින් අයදුම්පත් යොමු කළයුතු වේ.

අසම්පූර්ණ, අදාළ සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ජාතික යොවුන් සේනාංක මූලස්ථානය,**
**අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 .**

**සභාපති**
**ජාතික යොවුන් සේනාංකය**
**2021.02.05**